රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 29/2019

මගේ අංකය: EST-4/03/PMT/0253
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.09.18

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම**

2016.04.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014(ii) මඟින් අවලංගු කරන ලද ඉහත කරුණ හා සම්බන්ධව නිකුත් කර ඇති 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හා 2014.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014(i) කෙරෙහි අවධානය යොමු කරවමි.

02. ඉහත 25/2014 හා 25/2014(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය 2019.09.01 ලෙස සළකා එදිනට සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධරයන් එදින සිට මෙහි පහත සඳහන් i හා ii කොන්දේසිවලට යටත්ව ස්ථිර කිරීමට හැකිවන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හා 25/2014(i) යළි බලාත්මක කිරීමට 2019.09.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

i. ඉහත පරිදි ස්ථිර පත්වීම් ලබා දීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා සම්පූර්ණ කළ හැකි නිලධරයන් සඳහා ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලබා දීම.

ii. ඉහත i හි සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කළ නොහැකි නිලධරයන් සඳහා රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල යටතේ ස්ථිර පත්වීම් ලබාදීම.

03. ඉහත පරිදි ක්‍රියාකිරීමට අදාළ පත්කිරීමේ බලධරයන් ක්‍රියා කළ යුතු ය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය